# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2010 ජුනි මස 18 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2010.06.21 දින නිකුත් කරන ලදී)**


# තිදොර-තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**තිදොර-තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## තිදොර - තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි (සංස්ථාගත කිරීමේ)

### තිදොර - තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"තිදොර - තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි" යනුවෙන් සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ ආයතනයේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් හා ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2010 අංක දරන තිදොර - තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

තිදොර-තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) තිදොර - තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසියේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන්, (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන) "තිදොර - තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි"යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති ආයතනයක් විය යුතු ය. තව ද, ඒ නාමයෙන් ඒ ආයතනය විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ ආයතනයට ඇත්තේ ය.

2—PL 004927 — 80 (2010/06)

ආයතනයේ පොදු පරමාර්ථ.

3. ආයතනය සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා ය :—

(අ) ශ්‍රී ලංකාවේ සිටින ආබාධිත සහ අවාසිසහගත තත්ත්වයට පත් වූවන්ගේ නිර්මාණාත්මක කුසලතා ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් ශ්‍රී ලාංකීය ජන සමාජය හා අන්තර්කරණය කිරීම ;

(ආ) ආබාධිත සහ අවාසිසහගත තත්ත්වයට පත් වූවන්ගේ ආත්මාභිමානය ශ්‍රී ලාංකීය සමාජ ව්‍යුහය තුළ ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව තුළ සිටින ආබාධිත හා අවාසිසහගත තත්ත්වයට පත් වූ තැනැත්තන්ට එරෙහි වෙනස්කම් කිරීම්වලට විරුද්ධව ක්‍රියා කිරීම හා ඔවුන්ගේ ආරක්ෂාව සඳහා වන නීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමට මැදිහත් වීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ පිටරටක දී ආයතනයට සමාන අරමුණු ඇති වෙනත් සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) ආයතනයේ කටයුතු ආයතනයේ රීතිවලට යටත්ව එම රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වූ ද, ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) ආයතනයේ ආරම්භක සාමාජිකයා වූ රෝහණ දේව පෙරේරා මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම හෝ එකතු කිරීම, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා

අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහකිරීම ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉෂ්ට කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දේවල් හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

ගිණුම් විගණනය කිරීම.

**6.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය අප්‍රේල් මස 01 වන දින සිට මාර්තු මස 31 වන දින දක්වා වන වර්ෂයක් විය යුතු ය.

(2) සංස්ථාවට ලැබෙන සියලුම ආදායම් හා වියදම් සහ වත්කම් හා බැරකම් පිළිබඳවත් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳවත් නිසි ගිණුම් පවත්වාගෙන යාමට, සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින්, සංස්ථාවේ ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එවැනි ආයතනයක පාලක සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇත්තා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) ගණකාධිකාරී ව්‍යාපාරික ආයතනයක එක් එක් වාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ පාලක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් තමා සතුව ඇත්තා වූ ද, ගණකාධිකාරී ව්‍යාපාරයක්,

අදහස් වේ.

සංස්ථාවේ රීති.

**7.** (1) සාමාජිකයන් ඇතුළු කර ගැනීම, නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම සඳහා ද කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සඳහා ද, කළමනාකරණ කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල දී කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පරිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ලැබූ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින් සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. එවැනි රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයකින් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සෑම සාමාජිකයෙක්ම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ ආදායම හා දේපළ අදාළ කර ගැනීම.

**8.** කවර ආකාරයකින් හෝ සංස්ථාවට ලැබෙන මුදල් සහ දේපළ මෙහි දක්වා ඇති අරමුණුවල ප්‍රවර්ධනය සඳහා පමණක් යොදාගත යුතු අතර, එහි යම් කොටසක්, ලාභාංශයක්, ණය, ප්‍රසාද දීමනාවක් හෝ අන්‍යාකාරයකට හෝ ලාභ වශයෙන් කෙලින්ම හෝ අන්‍යාකාරයකට සංස්ථාවේ භාරකරුවන්ට ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

සංස්ථාවට නිශ්චල හෝ චංචල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මත හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කර දෙනු ලබන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහිලා හැකියාව හා ශක්නුතාව ඇති අතර, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව ඒ දේපළ විකිණීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු ණය.**

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ සංස්ථාවේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංස්ථාවට ගෙවිය යුතු සියලු ණය, සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**11.** සංස්ථාවේ සභාපතිවරයා සහ පාලක මණ්ඩලය විසින් නම් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් දෙදෙනකුගෙන් එක් අයෙක් ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.**

**12.** සංස්ථාව ගණන් බේරා වසා දැමීමේ දී හෝ විසුරුවා හැරීමේ දී එහි ණය සහ බැරකම් ගෙවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරිව ඇත්නම්, එම දේපළ සංස්ථාවේ භාරකරුවන් අතර නොබෙදිය යුතු නමුත්, සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති සහ එහි යම් ආදායමක් හෝ දේපළක් එහි සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ලබා දීම හෝ මාරු කිරීම කළ යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**14.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.